# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## පුරවැසි අධ්‍යාපනය

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය:........................................ 2024-08-

| 7 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

සැලකිය යුතුයි :

- I කොටසේ සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

---

- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) න්‍යෂ්ටික පවුල් ඒකකයක දක්නට ලැබෙන ලක්ෂණයක් ඇතුලත් පිළිතුර තෝරන්න.
   1. මව, පියා දරුවන් ඥාතීන් එකට ජීවත් වීම.
   2. මව, පියා හා දරුවන් පමණක් එකට ජීවත් වීම.
   3. මව, පියා හා ඔවුන්ගේ දෙමාපියන් සතුටින් ජීවත් වීම.
   4. මව, පියාගේ සහෝදර සහෝදරියන් යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීම.

2) යහපත් පුරවැසියකු සතුවිය යුතු ගුණාංගයකි,
   1. සරල දිවිපැවැත්ම.
   2. වංකබව.
   3. ආත්මාර්ථකාමීබව.
   4. අන්‍ය මත ගරු නොකිරීම.

3) ඔබගේ අනන්‍යතාව පෙන්විය හැකි ක්‍රමයකි.
   1. දුරකථන අංකය
   2. නම
   3. මාපට ඇඟිලි සලකුණු
   4. භාවිත කරන පොත්පත්

4) සමාජයේ පවතින අහිතකර බලවේගයකි.
   1. යහපත් මිතුරන්
   2. හොඳ පොත්පත්
   3. පවුල
   4. මත්ද්‍රව්‍ය

5) කළණ මිතුරෙකු තුළ තිබිය යුතු ගුණාංග වන්නේ,
   1. හොඳ ගති පැවතුම් තිබීම.
   2. බුද්ධිමත්ව කටයුතු කිරීම.
   3. හොඳ නරක පෙන්වා දීම.
   4. ඉහත සියල්ලම.

(ලකුණු 2×5=10)

- අංක 06 සිට 10 දක්වා ඇති වගන්ති නිවැරදි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් ( × ) ලකුණ ද, ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

6) නීත්‍යානුකූල නොවන ක්‍රියාවල නිරත වීම, අසල්වැසියන්ට සුහදතාවයට හේතු වේ. (..........)
7) ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා ඩබ්.ඩී.අමරදේව මහතා ය. (..........)
8) අපට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේදී විචාරශීලීව කටයුතු කිරීම වැදගත් වේ . (..........)
9) සමීප අන්තර් පුද්ගල සබඳතා තුළින් පවුලේ සාමාජිකයෝ එකිනෙකා සමග බැඳී පවතී. (..........)
10) ඔබගේ මවගේ සොහොයුරා "මාමා" ලෙස හැඳින්වේ. (..........)

(ලකුණු 2×5=10)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා A හා B කොටස් නිවැරදි ලෙස ගළපා යා කරන්න.

| A | B |
|---|---|
| 11) ක්‍රීඩාවක යෙදීමෙන් වර්ධනය වේ. | i . ආහාර හා පෝෂණය. |
| 12) අයහපත් චිත්තවේග පාලනයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයකි. | ii . හොඳ මාධ්‍ය වැඩසටහන්. |
| 13) පුද්ගලයකු තුළ වර්ධනය කරගත යුතු සාරධර්මයකි. | iii . පොත් පත් කියවීම. |
| 14) සමාජයේ පවතින හිතකර ආයතනයකි. | iv . නීති ගරුක බව. |
| 15) පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකමකි. | v . නිහතමානී බව |

(ලකුණු 2×5=10)

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට පිළිතුර තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

16) ජන සමාජයේ පවතින සිවිල් අයිතාවාසිකමකි ..............................................

17) ආහාර, නිවාස, ඇඳුම්-පැළඳුම් අපගේ .............................................. අවශ්‍යතා වේ.

18) සමාජය තුළ ජීවත්වීමේ දී විවිධ .............................................. වලට මුහුණ දීමට සිදුවේ.

19) අයිතිවාසිකම් භුක්ති විඳීමට ප්‍රථම සමාජය සම්බන්ධයෙන් නම .............................................. ඉටු කිරීම වැදගත් වේ.

20) දෛනිකව වැදගත් වන තොරතුරු අතර .............................................. දැක්විය හැකිය.

( අදහස් ප්‍රකාශ කිරීම , කාලගුණික තොරතුරු , යුතුකම් , අභියෝග , මූලික )

(ලකුණු 2×5=10)

## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුලු තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

1)
   i. වර්තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක දෙකක් ලියන්න.
   ii. අසල්වාසීන් සමග සුහදව කටයුතු කරන අවස්ථා දෙකක් ලියන්න.
   iii. පුද්ගලයකුට හිමි දේශපාලන අයිතිවාසිකම් දෙකක් ලියන්න.
   iv. ඔබගේ ජීවන අරමුණු දෙකක් ලියන්න.
   v. සමාජයේ යහපතට හේතුවන ආයතන දෙකක් ලියන්න.
   vi. විවේක කාලයේ දී පහසුවෙන් කළ හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.
   vii. පාරිභෝගිකයෙකු භාණ්ඩයක් මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.
   viii. දෙමාපියන්ට ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.
   ix. ජන සමාජයේ ඇති අන්තර් සම්බන්ධතා පවත්වන ආයතන දෙකක් ලියන්න.
   x. යහපත් පුරවැසියෙකු ලෙස ජීවත්වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න.

( ලකුණු 2 × 10 = 20 )

2)

i. න්‍යෂ්ටික පවුලකට සාපේක්ෂව විස්තෘත පවුල් ඒකකයකට දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

( ලකුණු 2 )

ii. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ තුනක් ලියන්න.

( ලකුණු 3 )

iii. පවුලේ සාමාජිකයෙකු ලෙස ජීවත් වීම නිසා අත්වන ප්‍රයෝජන පහක් ලියන්න.

( ලකුණු 5 )

3)

i. ඔබගේ අනන්‍යතාවය පෙන්වන ජීව විද්‍යාත්මක සාධක දෙකක් ලියන්න.

( ලකුණු 2 )

ii. පවුලේ සාමාජිකයකු ලෙස වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග තුනක් ලියන්න.

( ලකුණු 3 )

iii. ජන සමාජයේ පවතින හිතකර බලවේග පහක් ලියන්න.

( ලකුණු 5 )

4)

i. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

( ලකුණු 2 )

ii. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම නිසා අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න.

( ලකුණු 3 )

iii. ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයකු තුළ වර්ධනය වන ගුණාංග පහක් ලියන්න.

( ලකුණු 5 )

5)

i. පුද්ගලයකු තුළ ඇතිවන්නා වූ චිත්තවේග දෙකක් ලියන්න.

( ලකුණු 2 )

ii. අයහපත් චිත්තවේගයන් පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් තුනක් ලියන්න.

( ලකුණු 3 )

iii. පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් පහක් ලියන්න.

( ලකුණු 5 )

6)

i. අයිතිවාසිකම් බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න.

( ලකුණු 2 )

ii. සිවිල් අයිතිවාසිකම් තුනක් ලියන්න.

( ලකුණු 3 )

iii. වර්තමාන සමාජයේ බොහෝ සාමාජිකයින් මුහුණ දෙන අභියෝගාත්මක අවස්ථා පහක් ලියන්න.

( ලකුණු 5 )

7)

i. සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ඇතිවිය හැකි අවාසි දෙකක් ලියන්න.

( ලකුණු 2 )

ii. ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීමෙන් ඇතිවිය හැකි බලපෑම් තුනක් ලියන්න.

( ලකුණු 3 )

iii. අභියෝග ජය ගැනීමට කළ යුතු ක්‍රියා මාර්ග පහක් ලියන්න.

( ලකුණු 5 )

REGISTRAR
De Mazenod College
Kandana.